පුවත් පත

ශ්‍රී ලංකාව

# මිනිසත්බව අගයන බන්ධනාගාර පද්ධතියක් කරා

**2018 අප්‍රේල් - ජූනි**



ICRC

බන්ධනාගාරයක් ඉදිකළ විට එය පරම්පරා ගණනාවක් පැවතීමට අවශ්‍යබව සහ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ විවිධ රැඳවියන් සහ ප්‍රවණතා අනුව එය ක්‍රියාත්මක වියයුතු බව අපි දනිමු. අප අවධානය යොමුකරන කරුණු එනම් සැලසුම් කිරීමේ දී වැදගත්වන කරුණු කෙරෙහි යොමුවෙමු. බන්ධනාගාරයක පරිසරය, අන් පරිසර මෙන් එම පරිසරය තුළ ජීවත්වන සහ වැඩකරන ප්‍රජාවට මෙන්ම, එම බන්ධානාගාර කරා පැමිණෙන තැනැත්තන්ට සහ ඔවුන්ට සම්බන්ධ කොටසක් වන අවට වෙසෙන ප්‍රජාවන්ට ගැඹුරු බලපෑම් කරති. බන්ධනාගාරයක්, අවමයක් ලෙස මානුෂවාදී සම්මතයන් සමඟ එකතුවී ඇති උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලියකින් ඇතිකරගත් සාකච්ඡා සහ තීරණ වල එකතුවක් විය යුතුය. අවසානයේ එමගින් ලැබෙන ඵලයවන්නේ මිනිසත් බව අගයන බන්ධනාගාරයකි.

ඕනෑම බන්ධනාගාර ගොඩනැගිලි ව්‍යාපෘතියක් පළමුවෙන් මානුෂවාදී මූලධර්ම පාදක කරගතයුතු බව ජාත්‍යන්තර රතුකුරුස කමිටුව විශ්වාස කරයි. බන්ධනාගාර සැලසුම් සහ නිර්මාණ කිරීම මානවවාදී මූලධර්ම හතරක් මත පාදකවී ඇත. ඒවා මැන්ඩෙලා රීතිවල මුල්බැස ගෙන ඇත. එම මූලධර්මවන්නේ:- පීඩා සිදුනොකිරීම, පියවිබව උපරිමයෙන් පවත්වා ගෙනයාම, සෞඛ්‍ය හා පුද්ගලික වර්ධනය සහ සමාජය සමග සම්බන්ධතාවක් පවත්වා ගෙනයාමයි.

ඵලදායි බන්ධනාගාරයක් සැලසුම් කිරීමේ ක්‍රියාවලියට පියවර ගණනාවක් ඇතුලත් වන අතර එය ආරම්භවන්නේ බන්ධනාගාර බලධාරීන් සමග කරුණු සාකච්ඡා කිරීමෙනි. ඉන් අනතුරුව නෛතික රාමු සැලසුම් කිරීම සහ අවසානයේදී බන්ධානාගාරයට සිරකරුවන් ඇතුලත් කිරීමෙන් පසුව කරුණු ඇගයීම සහ උගත් පාඩම් එයට ඇතුලත්ය. ජාත්‍යන්තර රතුකුරුස කමිටුවේ කොළඹ දූත මණ්ඩලය බන්ධනාගාර දෙපාර්තමේන්තුව සමග මෙම ක්‍රියාවලියේ යෙදී සිටින අතර ශ්‍රී ලංකාවේ අනාගතයේ සිදුකෙරෙන බන්ධනාගාර සැලසුම්වලට මැන්ඩෙලා රීති සහ මෙම නෛතික රාමුව අන්තර්ගත කිරීම පිණිස දැනටමත් මේ වසරේදී වැඩමුළු තුනක් පවත්වා ඇත.

මෙම ප්‍රවේශය භාවිතයට ගැනීම දිරිගැන්වීමෙන් අප බලාපොරොත්තු වන්නේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව, පුනරුත්ථාපනය, සුවදායි නැවතුම් ඉඩකඩ ලබාදීම, වැඩකිරීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම සහ සේවය සලසන ප්‍රජාවේ සමාජිකයෙකුවීමයි. කෙටියෙන් කිවහොත් මිනිසත්බව අගයන බන්ධනාගාර පද්ධතියකි.

1989 සිට ජාත්‍යන්තර රතුකුරුස කමිටුව ශ්‍රී ලංකාව පුරා පුද්ගලයන් රඳවා තබන ස්ථානවල සංචාරයේ යෙදෙමින් සිටී. මෙම සංචාරවල යෙදීමේ අරමුණ වන්නේ මිනිසත්බවට සරිලන තත්වයන් යටතේ පුද්ගලයන් රඳවා තැබීමට සහ ඔවුන්ට සැලකීමට බන්ධනාගාර අධිකාරීන් දරන ප්‍රයත්නවලට සහායවීමයි.



අධිකරණ වෛද්‍ය සහ ධූලකවේද ආයතනය සමග සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජානක සුගතදාස සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටු දූත මණ්ඩල ප්‍රධානි ජරාඩ් පේට්රිග්නෙ යන මහත්වරුන් ගිවිසුමට අත්සන් කිරීම

# ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව: මානුෂවාදී සේවා ඉටුකිරීමේ විකාසය

ස්විට්සර්ලන්තයේ උපත ලද ජරාඩ් පේට්රිග්නෙ ආර්ථික විද්‍යාඥයෙකි. ඔහු දශක තුනකට වැඩිකාලයක සිට ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සේවය කරයි. මේ කාලය තුළදී නියෝජිතවරයෙකු ලෙස සේවය කර ඇති ඔහු ලතින් ඇමරිකාවේත්, අප්‍රිකාවේත්, 1995 සිට 1997 දක්වා ශ්‍රී ලංකාවේත්, මැදපෙරදිග සහ ආසියාවේත් ජාත්‍යන්තර රතු කුරුස කමිටු දූත මණ්ඩල සහ කලාපීය දූත මණ්ඩල දහයක කළමනාකරණ තලයේ සේවාවන්හි නිරතවී ඇත. වසර 21 කට පසුව ඔහු දූතමණ්ඩල අන්තර්වාර ප්‍රධානි ලෙස තෙමසක දූත මෙහෙයක් සඳහා නැවත ශ්‍රී ලංකාවට පැමිණ සිටී. නොබෝ දිනකින් ඔහුගේ සේවා කාලය නිමවෙයි. මෙම කෙටි සම්මුඛ සාකච්ඡාවේදී ඔහු මෙරට මානුෂවාදී සේවා සැපයීමේ සිදුවී ඇති වෙනස්කම් මෙනෙහි කරයි.

### ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ඉටුකරන කාර්යයන් ගැටුම් සහ සාමය පවතින කාලය අතර ක්‍රමයෙන් විකාසයවී ඇත. එම කාලයේ ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් මොනවාද?

එම කාලයේදී අපි ගැටුමෙන් පීඩාවට පත්ව සිටි ජනතාවට හදිසි ආධාර ලබාදෙමින් ශ්‍රී ලංකා රජය සහ ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර මධ්‍යස්ථ අතරමැදියෙකු ලෙස කටයුතු කළෙමු. ඊට අමතරව සන්නද්ධ හමුදා සාමාජිකයන්, එල්ටීටීඊ සාමාජිකයන් සහ වෙනත් සන්නද්ධ කණ්ඩායම් අතර ජාත්‍යන්තර මානුෂවාදී නීතියට ගරුකිරීම ප්‍රවර්ධනය කළෙමු. එල්ටීටීඊ බලය පැවති ප්‍රදේශවල දිවිගෙවූ ජනතාවට සැපයීම පිණිස අත්‍යවශ්‍ය ආහාර සහ බෙහෙත් ද්‍රව්‍ය රැගෙනයාමට සහ තුවාල ලබාසිටි පුද්ගලයන් සහ රෝගීන් ඉවත් කරගැනීමට අපි අදාළ බලධාරීන් සමග සම්බන්ධීකරණ කටයුතු පවත්වා ගෙන යමින් ත්‍රිකුණාමලය සහ යාපනය අතර සතිපතා භාණ්ඩ ප්‍රවාහන නෞවිකාවක් යොදා ගත්තෙමු.

### ගැටුම නිමවී වසර නවයක් ගෙවී ඇති අතර ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සේවා සැලසීමට ඇති අදාළත්වය කුමක්ද?

අපගේ භූමිකාව විකාසයවී ඇත. වර්තමානයේ අපි ගැටුමෙන් උද්ගතව පවතින චිරස්ථායි ඵලවිපාක ආමන්ත්‍රණය කරමින් ඒවාට ප්‍රතිචාර දැක්වීමට බලධාරීන් සහ දේශීය සංවිධාන දරන ප්‍රයත්නයන්ට ආධාර කරමු. අපගේ කාර්ය පෙළගැස්මෙහි එක් ප්‍රධාන අංගයක් වන්නේ අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ ගැටලුවයි. මේ සම්බන්ධයෙන් අදාලවන නීති රැසක් පිළිබඳව අප බලධාරීන්ට උපදෙස් සපයා ඇති අතර අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට පුළුල් ලෙස ආධාර කිරීම පිණිස විස්තීර්ණ වැඩසටහනක් අරඹා ඇත. (ඡායාරූපය) අධිකරණ වෛද්‍ය ප්‍රජාව සතු තාක්ෂණ ධාරිතාව ශක්තිමත් කිරීම පිණිස එම ප්‍රජාව සමඟද අපි වැඩසටහන් ක්‍රියාත්මක කරමු. ක්‍රමානුකූල උපදෙස් ලබාදීම, සෞඛ්‍ය සහ සනීපාරක්ෂක පහසුකම් ඉහළ නැංවීම, බන්ධනාගාරවලදී සහ පොලිස් ස්ථානවලදී රැඳවියන්ට සැලකීම හා රැඳවුම් තත්වයන් තක්සේරු කිරීම ඇතුලු ඒකාබද්ධ සහ ව්‍යුහාත්මක එළඹුමකින් යුතුව අපි පුද්ගලයන් රඳවාගෙන ඇති ස්ථානවල චාරිකාවල නිරත වෙමු.

### ජාත්‍යන්තර රතු කුරුස කමිටුව කෙතෙක් කල් ශ්‍රී ලංකාවේ රැඳීසිටීද?

අපගේ ප්‍රවේශය අදාල ක්‍රියාමාර්ගවලට සහ ආයතනවලට ආධාර කරන ද්විත්ව අරමුණුවලින් යුත් මැදිකාලීන එකකි. කොළඹ අපගේ කලාපීය විශේෂඥයන් සහ කලාපීය සම්මන්ත්‍රණ හා පුහුණුකිරීම් සඳහා කේන්ද්‍රස්ථානයක්ද වෙයි.

# තාක්ෂණ සහ වෛද්‍ය නීති සේවා පුහුණු සැපයීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ඉදිරිපත්වෙයි

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, කොළඹ මූලස්ථාන කොට ගත් අධිකරණ වෛද්‍ය සහ ධූලකවේද ආයතනයට මෙහෙයුම් සහ කාර්යපටිපාටි ප්‍රමිතිකරණය, ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට පාත්‍රවී ඇති ප්‍රශස්ත භාවිතයන් හඳුන්වාදීම සහ කාර්ය මණ්ඩල පුහුණු කිරීම වැනි ක්ෂේත්‍රවලදී අවම තත්ව සහතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට තාක්ෂණ සහ පොදු අවශ්‍යතා සඳහා ආධාර කරයි. මියගිය පුද්ගලයන් සහ ආශ්‍රිත දත්ත කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ අධිකරණ වෛද්‍ය සහ ධූලකවේද ආයතනය ශ්‍රී ලංකාවේ ආශ්‍රේය මෘත ශරීරාගාරය කිරීම අරමුණු කරගත් නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කෙරේ.

වෛද්‍ය නීතිසේවාවන් දියුණු කිරීමෙන් තනි සිදුවීම් (අපරාධ නඩු, හදිසි අනතුරු, හඳුනානොගත් පුද්ගලයන්), හෝ ස්වාභාවික ආපදා, සංක්‍රමණ මාර්ගවලදී සිදුවන මරණ හෝ ගැටුම් අවස්ථාවලදී සහ පශ්චාත් ගැටුම් අවශ්‍යතා වැනි මහා පරිමාණ/ සංකීර්ණ වූ සියලු ආකාරයේ තත්වයන්හි ප්‍රතිඵලදායක වෙයි.



# පාර්ශවකරුවෝ මරණ පරීක්ෂණ පිළිබඳ නෛතික රාමුව සකසා අවසන් කිරීමට රැස්වෙති

මරණ පරීක්ෂණ පිළිබඳ 4 වැනි උපදේශන වැඩමුළුව අප්‍රියෙල් මාසයේදී පවත්වන ලදී.

මරණ පරීක්ෂණ පැවැත්වීමට අදාළව පවතින නීති, කාර්යපටිපාටි සහ භාවිතයන් ප්‍රතිසංස්කරණය පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා 2015 දී අධිකරණ ඇමතිවරයා විසින් පිහිටුවන ලද කමිටුව සමඟ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව එය සංවිධානය කළේය.

මෙම වැඩමුළුව පැවැත්වීමේ අරමුණවූයේ නීතියක් බවට පරිවර්තනය කිරීම පිණිස එය අධිකරණ ඇමතිවරයාට බාරදීමට පෙර නීතිරාමුවේ අවසන් කෙටුම්පත සම්බන්ධයෙන් සියලු පාර්ශවකරුවන්ට සිය මත පලකිරීමට අවස්ථාව සැලසීම සහ ඔවුන්ගෙන් එයට ප්‍රතිපෝෂණයක් ලබා ගැනීමයි. මෙම කමිටුව සමග ඉතා සුහඳ සම්බන්ධතාවක් පවත්වා ගෙන යන ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට හඳුනානොගත් මළසිරුරු හඳුනා ගැනීමට අදාළවන සහ මරණ සම්බන්ධයෙන් පවත්වන විමර්ශනවලට අදාළ පවුල් සම්බන්ධ කරගැනීමට අවශ්‍යවීම යන සැලකිල්ලට ගතයුතු වැදගත් මානුෂවාදී කරුණු පිළිඹිබුවන ආකාරයෙන් අවසන් කෙටුම්පතට සංශෝධන සිදුකිරීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට හැකිවිය.

මෙම වැඩමුළුවට අධිකරණ අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, විදේශ කටයුතු සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යන අමාත්‍යාංශවලින් සහ නියෝජිතායතනවලින් ඉහල මට්ටමේ නිලධාරීහු සහභාගිවූහ. සහභාගිවූවන් පැවැත්වූ සජීවි සහ ඵලදායි සාකච්ඡා මෙම නීතිරාමුව අවසන් කරගැනීමේ ආසන්නයට පැමිණීමට මග සැලසිණි. සන්නද්ධ ගැටුම්, ආපදා, සංක්‍රමණ සහ අත්අඩංගුවේ පසුවෙද්දී සිදුවන මරණවලට සම්බන්ධ මිනිස් මළසිරුරු කළමනාකරණය පිණිස මෙම නීතියෙහි ඇති වැදගත්කම පිළිගන්නා ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, මෙම ක්‍රියාවලියේ ඊළඟ වැදගත් පියවර වන රීති මාලාවක් සහ සම්මත මෙහෙයුම් කාර්යපටිපාටි සකස් කිරීම පිණිස බලධාරීන්ට එහි ආධාර ලබාදීමට ඉදිරිපත්වී සිටී.

# තොරතුරු සහ සංඛ්‍යා ලේඛන

## අප්‍රේල් - ජූනි 2018

### අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම

පුද්ගලයන් සොයා ගැනීම පිණිස කරතිබූ විමසීම්වල පසුවිපරම්වල යෙදීම පිණිස පවුල් 890 ක් හමුවීම සහ පුද්ගලයන් අතුරුදහන්වීමේ නව සිද්ධි 73 ක් ලියාපදිංචි කිරීම; අතුරුදහන් වූ පුද්ගලයන් 500 කට වැඩි සංඛ්‍යාවකගේ ඥාතීන්ට (සහායක වැඩසටහන මගින්) සතිපතා මනෝසමාජීය ආධාර සැසි පැවැත්වීම සහ ඔවුන්ගෙන් ආර්ථික, නෛතික සහ පරිපාලන, අධ්‍යාපන, සෞඛ්‍ය යන අවශ්‍යතා සහිත 50 දෙනෙකු සම්පත් මධ්‍යස්ථාන කරා යොමු කිරීම; තමන් ගේ ජීවනෝපායන් දියුණු කරගැනීම පිණිස පවුල් 110 කට මුදලින් ආධාර කිරීම.

### රැඳවියන් ගේ සුබසාධනය

රටපුරා පුද්ගලයන් 3,400 ක් රඳවා සිටින ස්ථාන 11 ක සංචාර 18 ක යෙදීම සහ එම සංචාරවලින් සොයාගත් කරුණු සහ නිර්දේශ රැඳවුම්බාර බලධාරීන් සමග රහසිගතව බෙදා ගැනීම. රැඳවුම් මධ්‍යස්ථානවල සිටින ස්වකීය ඥාතීන් බැලීමට යාම පිණිස පවුල් 74 කට දීමනා ගෙවීම. රැඳවියන් 403 දෙනෙකුට එම වේලාවේ ඇති අවශ්‍යතා අනුව අධ්‍යාපන සහ විනෝදය පිණිස අවශ්‍ය අයිතම සපයන ලදී.

### ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම

සාම ආධාරක මෙහෙයුම් අභ්‍යාස ආයතනයේදී 27 වැනි විභව නිරීක්ෂණ සහ මාණ්ඩලික නිලධාරි පාඨමාලාව හදාරණ යුදහමුදා නිලධාරීන් 34 දෙනෙකුට ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ගැන කරුණු පැහැදිලි කිරීමේ සැසි පැවැත්වීම; ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේදී සිංහල පොලිස් කොස්තාපල්වරියන් 153 දෙනෙකු සහ දෙමළ කොස්තාපල්වරුන් 30 දෙනෙකු සහ පරිවාස උප පොලිස් පරීක්ෂකවරුන් 177 දෙනෙකු උදෙසා හා ගිනිඅවි භාවිතය සහ පුද්ගලයන් රඳවාගැනීම පිළිබඳව එක්දින පුහුණුවක් ලබාදීම. සන්නද්ධ සේනාංක රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී යුදහමුදා නිලධාරීන් 26 දෙනෙකු වෙනුවෙන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ සිව්දින පාඨමාලාවක් පැවැත්වීම. එය සංවිධානය කරන ලද්දේ එතර මෙහෙයුම් අංශය විසිනි. මධ්‍යම ආසියානු ජනරජයේ සේවාව සඳහා යොදවනු ලබන ගුවන් හමුදාවේ සංතරණ නියුක්තිකයන් 126 දෙනෙකු වෙනුවෙන් එක්සත් ජාතීන් ගේ සාමසාධක මෙහෙවර ගැන කරුණු පැහැදිලි කිරීමේ සැසි පැවැත්වීම; අනුරාධපුරයේ භික්ෂු විශ්ව වියාලයේ විද්වත් භික්ෂූන් වහන්සේ දෙනමකට නේපාලයේ පැවති දකුණු ආසියානු ඉගැන්වීමේ සැසියකට සහභාගිවීමට අනුග්‍රහය දැක්වීම සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යයන සේවා නියුක්තිකයෙක් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ නීති නිලධාරියෙක් බංග්ලාදේශයෙහි පැවති ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ උසස් පාඨමාලාවකට සහභාගිවූහ.

### ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ආධාර

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව, මුලතිව්, වව්නියාව සහ රත්නපුර ශාඛාවල කාර්ය මණ්ඩලයේ සහ ස්වේච්ඡා සේවකයන් 85 දෙනෙකුට කඳවුරු කළමනාකරණය සහ ආපදාවලදී ප්‍රතිචාර දැක්වීමේ ශිල්පක්‍රම ගැන පුහුණුව ලබාදීම; ජලගැල්මෙන් සහ නියඟයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ට ලබාදීම පිණිස ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ජල බඳුන්, පාසල් බෑග සහ පොත් ජාත්‍යන්තර රතු කුරුස කමිටු විසින් සපයන ලදී. මානුෂවාදී මූලධර්ම සහ රතු කුරුස සහ රතු අඩසඳ ව්‍යාපාරය පිළිබඳව අලුතින් එක්වූ ස්වේච්ඡා සේවකයන්, සිසුන්, වෘත්තිකයන් සහ පොදු ජනතාව උදෙසා ශ්‍රී ලංකා රතු කුරුස සමාජය දැනුවත් කිරීමේ සැසි 18 ක් පැවැත්විය. මෙම මූලික ප්‍රතිපත්ති ප්‍රවර්ධනය පිණිස ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ආධාර සැපයීය. ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ ප්‍රථමාධාර උපදේශකයන් 55 දෙනෙකු වෙනුවෙන් දැනුම යාවත්කාලීන කිරීම පිණිස ජාත්‍යන්තර රතු කුරුස කමිටුව පුහුණු සැසි දෙකක් සංවිධානය කළේය. ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ රත්නපුරය, කෑගල්ල, කිලිනොච්චිය සහ වව්නියා ශාඛා විසින් ප්‍රථමාධාර සේවා 4 ක් පවත්වන ලද අතර ඉන් 2,000 කට වැඩි පිරිසකට ප්‍රථමාධාර ලබාදීමට හැකිවිය.


**ජාත්‍යන්තර රතු කුරුස කමිටුව**
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5
ශ්‍රී ලංකාව
දුරකථන +94 (11) 250 33 46 ෆැක්ස් +94 (11) 250 33 48
ඊ මේල් : colombo@icrc.org
වෙබ් : www.icrc.org

**වව්නියාව කාර්යාලය**
70, වයිරවර් කෝවිල පාර, වයිරවර්පුලියන්කුලම්
වව්නියාව
දුරකථන +94 (0) 24 222 28 55 ෆැක්ස් +94 (0) 24 222 28 37

**මඩකලපුව කාර්යාලය**
මන්රීසා පාර
කොතුකුලම්, පිලයාරඩි
මඩකලපුව
දුරකථන +94 (0) 65 222 70 70


©ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, ජනවාරි 2018


ICRC

facebook.com/icrc
twitter.com/icrc
instagram.com/icrc


2018.0624/002 06.2018 200